# පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

# ආසියානු සංවර්ධන බැංකු මූල්‍යාධාර සපයන මහ කොළඹ ජල සහ අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීම ආයෝජන වැඩසටහන (ණය අදියර III)

කොළඹ මහ නගර සහා බල ප්‍රදේශය ආවරණය වන අයුරින් 2016 සිට 2019 දක්වා ඇ. ඩො. මිලියන 112.83 ක වියදමින් මහ කොළඹ ජල සහ අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීම ආයෝජන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා රජය කටයුතු කරනු ලැබේ. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ වඩා හොඳ අපජල කළමනාකරණ සේවාවක් ලබාදීමෙන් මහ කොළඹ නගර වාසීන්ගේ මහජන සෞඛ්‍ය සහ නාගරික පරිසරය සංවර්ධනය කිරීමයි.

මෙම ව්‍යාපෘතිය කොළඹ මහා නගර සභාව මගින් ක්‍රියාත්මක කරන අතර, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් මෙහෙයවනු ලබයි. ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ අධ්‍යක්ෂක තනතුර සඳහා අදාළ සුදුසුකම් සහිත පුද්ගලයෙකු බඳවා ගැනීමට අමාත්‍යාංශය අපේක්ෂා කරයි.

## ව්‍යාපෘති අධ්‍යක්ෂක - තනතුර 01

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් විෂය ක්ෂේත්‍රයට අදාළව ලබාගත් උපාධියක් සමග, උපාධිය සම්පූර්ණ කළ දින සිට අවම වශයෙන් කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 14 ක පළපුරුද්දක් තිබීම, මෙයින් වසර 07 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් ලබා තිබීම අනිවාර්යය වේ. **හෝ**
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක්

   **සමග**

   විෂය ක්ෂේත්‍රයට අදාළව ලබාගත් පශ්චාත් උපාධියක් හෝ විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වෘත්තීය ආයතනයක පූර්ණකාලීන සාමාජිකත්වය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 12 ක පළපුරුද්ද.

- පොදු අපජල කළමනාකරණය හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ඇති අයදුම්කරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

**වැටුප් තලය :** රු. 180,000.00 – රු. 200,000.00 (2016.03.24 දිනැති අංක 01/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ PS1 මට්ටම) මෙයට අමතරව රජයේ අනුමත අනෙකුත් දීමනාවන්ද ගෙවනු ලැබේ.

**පොදු කොන්දේසි :**

- **වයස :** අවුරුදු 65 ට අඩුවිය යුතුය. (2016.10.18 දිනට)
- සේවකයාගේ සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම් ප්‍රතිශතය මාසික වැටුපෙන් 8% ක්ද,සේව්‍යයාගේ සේවක අර්ථසාධක අරමුදල් ගෙවීමේ ප්‍රතිශතය 12% ක්ද, සේවක භාරකාර අරමුදල් ගෙවීම 3% ක් ද වේ.
- සේවා කොන්දේසි – සියලුම බඳවා ගැනීම් මූලික වශයෙන් එක් වසරක් සඳහා කොන්ත්‍රාත් පදනම මත වන අතර, ව්‍යාපෘති කාල සීමාව තනතුරේ අවශ්‍යතාවය සහ සතුටුදායක කාර්ය සාධනය මත සේවා කාලය වාර්ෂිකව කොන්ත්‍රාත් පදනම මත දීර්ඝ කිරීමේ අවස්ථාව පවතී.

රාජ්‍ය අංශයේ සේවය කරන නිලධාරීන් සිය අයදුම්පත්‍ර ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු අතර, මේ සඳහා උනන්දුවක් දක්වන පුද්ගලයන් ඔවුන්ගේ ජීව දත්ත තොරතුරු අදාළ අධ්‍යාපන සහතික හා පළපුරුද්ද පිළිබඳ සහතික වල පිටපත් සමග **ලේකම්, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, අංක 330, යූනියන් පෙදෙස, කොළඹ 02** ලිපිනයට 2016.11.08 වන දින ප.ව. 3.00 හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ව්‍යාපෘතියේ නම සහ ඉල්ලුම් කරනු ලබන තනතුර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.

**එච්. ටී. කමල් පත්මසිරි**
**ලේකම්,**
**පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.**